**සුරාබදු තැගි අරමුදල - 2018**
**-------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**
**----------------------------------**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදල 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සුරාබදු තැගි අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සුරාබදු තැගි අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සුරාබදු තැගි අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සුරාබදු තැගි අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදි ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01** | | |
| (i) සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අංක 2.1 මඟින් අරමුදලේ ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව වාර්තා කර තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි විධි විධානවලට පටහැනිව අරමුදලේ ගිණුම් මුදල් පදනම මත පිළියෙල කර තිබුණි. | මෙම ගිණුම් වාර්තා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව වාර්තා කරමි. එමෙන්ම ගිණුම් සටහන් අංක 7 මඟින් දක්වනු ලබන්නේ මෙම වාර්තාවලින් පෙන්නුම් කරන ගනුදෙනු මුදල් පදනම මත සිදුකර ඇති බවයි. එනම් ලැබිය යුතු ආදායම් හා වියදම් පිළිබඳව සටහන් මෙම ගිණුම් වාර්තා මඟින් පෙන්නුම් නොකරයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කරන්නේ නම් උපචිත පදනමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ii) අරමුදල වෙනුවෙන් භාණ්ඩාගාරයේ පවතින ක්ෂය සංචිත අරමුදල් ගිණුමේ රු.49,683,233 ක් වූ ශේෂය ජංගම නොවන වත්කමක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරිමේදී නිවැරදිව ගැලපීම සිදුකරමි. | නිවැරදි වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරිම. |
| **(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**<br>වටිනාකම රු.47,134,000 ක් වූ ගොඩනැගිල්ල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස දක්වා තිබුණ ද එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම විගණන දිනය වූ 2019 මාර්තු 30 දක්වාම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ගොඩනැගිලි වෙනුවෙන් ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි. | පිරිවැය රු.47,134,000 ගොඩනැගිලි සඳහා ඔබගේ උපදෙස් අනුව ක්ෂය ගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත් පරිදි තක්සේරු කර අයිතිය තහවුරු කර ගනිමින් ගිණුම්ගත කිරිම. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් පදනම මත ගිණුම් පිළියෙල කිරීම ගිණුම් ප්‍රතිපත්තියක් වුවද ත්‍යාග මුදල් ගෙවීම් කිරීමේදී සත්‍ය වශයෙන් ලැබී ඇති සමථ ගාස්තු පදනම් කරගෙන ත්‍යාග මුදල් නොගෙවන අතර ඒ සඳහා පාදක කර ගණුයේ තාක්ෂණ අංශය සඳහා වාර්තා වන සමථ ගාස්තු ලැබීම් (සිගරට් දඩ සමග) විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී ගිණුම් අංශයේ තොරතුරු අනුව සමථ ගාස්තු ලැබීම් සහ සිගරට් දඩ රු.177,875,203 ක් වූ අතර තාක්ෂණ අංශයෙන් ත්‍යාග මුදල් ගෙවීම සඳහා පදනම් කරගෙන තිබුණේ රු.133,474,335 ක් පමණක් විය. | සමථ ගාස්තු ලැබිම් සෘජුවම බැංකුවේ තැන්පත් කරන බැවින් සමහර අවස්ථාවලදී එම වාර්තා ප්‍රධාන කාර්යාලයට ලැබීමේ ප්‍රමාදයක් පැවතීම නිසා සියලුම නිලධාරීන්ට මුදල් තැන්පත් කල පසුව දින 07 ක් ඇතුලත අදාළ වාර්තා ලබාදිය යුතු බවට උපදෙස් ලබාදුන් අතර, ඉදිරියේදි මෙම තත්ත්වය නැවතත් ඇති නොවන ලෙස අදාළ කාර්යයන් සිදුකිරීමට කටයුතු කරමි. | උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම හා අංශ අතර වාර්තා තබා ගැනීමේදී අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීමට කටයුතු කිරිම. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලට අදාළව 2018 දෙසැම්බර් මාසය සඳහා ලැබී තිබුණු රු. 29,523,737 ක සමථ ගාස්තු ලැබීම් සහ රු.758,800 ක සිගරට් දඩ ආදායම් දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර වීම හේතුවෙන් එකතුව රු.30,282,537 ක් වූ ආදායම අරමුදලේ ගිණුම්වලින් අත්හැරී තිබුණි. | සමථ ගාස්තු සහ සිගරට් දඩ සම්බන්ධ ආදායම් වාර්තා ප්‍රධාන කාර්යාලයට ලැබී ගිණුම් ගත වන විට මාසයක් ප්‍රමාද වන බැවින් සෑම අවස්ථාවකම ඉදිරි මාසයේ ආදායම පසු මාසයට ගිණුම් ගත කිරීම සිදුවී ඇත. 2018 දෙසැම්බර් මස ලද සමථ ගාස්තු සහ සිගැරට් දඩ ආදායම 2019 ජනවාරි මස ගිනුම් ගත කර ඇතග ඉදිරියේදී ඒ සම්බන්ධව සමාලෝචනය කර උපචිත පදනම මත ගිණුම සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | උපචිත පදනම මත ගිණුම් පිලියෙල කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.36,759,028 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,646,537 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,112,491 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සඳහා සමථ ගාස්තු ලැබීම් ආදායම රු.42,711,176 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ඇති ක්ෂය සංචිත අරමුදලට බැර කරනු ලබන අතර 2018 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ රු.මිලියන 49.6 ක මුදලක් පැවතුනද එම අරමුදල ඵලදායී කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඵලදායී කාර්යයන් සඳහා ක්ෂය සංචිත අරමුදලේ ශේෂය යොදවා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | ක්ෂය සංචිත අරමුදල ඵලදායි කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කිරිම. |

| | | |
|---|---|---|
| (ආ) 1994 මාර්තු 4 දිනැති අංක 818 දරණ සුරාබදු නිවේදනය ක්‍රියාත්මක වී 2018 වර්ෂය වන විට වසර 24 ක් ඉක්මවා තිබීම, දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්ය මණ්ඩලයේ ඒ ඒ ශ්‍රේණි වල විවිධ වෙනස්කම් සිදු වී තිබීම, තෑගි මුදල් ගෙවීමේදී විවිධ අක්‍රමිකතාවයන් සිදු වී තිබීම සහ දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය පුළුල් වීම යනාදී කරුණු මත මෙම සුරාබදු නිවේදනය සංශෝධනය විය යුතු බවත්, ත්‍යාග මුදල් ගෙවීම පිළිබඳව විධිමත් ලිඛිත ක්‍රමවේදයක් අනුමත කරගත යුතු බවත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | මේ වන විට 1994 මාර්තු 04 දිනැති 818 දරණ නිවේදනය සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඒ වෙනුවෙන් කටයුතු සිදුකරමින් පවතී. | විධිමත් පරිදි සොයා බලා සුරාබදු නිවේදනය සංශෝධනය කිරීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිලධාරීන්ගේ පුහුණු සහ අධ්‍යයනය කටයුතු සඳහා සැලැස්මක් අනුමත කර ගැනීමකින් තොරව එම කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.5 ක් වෙන් කර තිබුණ ද කිසිදු පුහුණු කටයුත්තක් සංවිධානය කර නොතිබීම නිසා එම මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. ඉකුත් වර්ෂයේදී මෙම කාර්යය සඳහා අනුමත වී තිබුණු ප්‍රතිපාදන ද සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | අළුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සහ ආයතනයේ සේවය කරන නිලධාරීන් පුහුණු කිරීම සඳහා විධිමත් සැලැස්මක් සකස් කර තිබූ අතර සැලසුම් කරන ලද පාඨමාලා නොවැලක්විය හේතූන් මත නොපැවත්වීම, | නිලධාරීන්ගේ ඵලදායිතාවය වර්දනය කිරීම සඳහා වාර්ෂිකව පුහුණු වැඩ සටහන් පැවත්වීම හා තාත්ත්වික මට්ටමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම. |
| (ආ) අරමුදලේ අරමුණු වන ප්‍රසංසනීය වැඩ, නිර්භීත ක්‍රියා, ක්‍රීඩා, විනෝද හා සුභසාධන වැඩවලට ගෙවීම සහ විශේෂ වැටලීම් යනාදී කටයුතුවලට ගෙවීම සඳහා රු.මිලියන 1 ක මුදලක්ද, පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු.50,000 ක මුදලක්ද වෙන්කර තිබූ අතර මෙම වෙන් කිරීම් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. ඒ අනුව අරමුදලේ අරමුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවිය. | ප්‍රසංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් යනාදී ක්‍රියා 2018 වර්ෂය තුළ කිසිවක් වාර්තා වී නොමැත. එම නිසා මෙම මුදල් ඉතිරි වී ඇත. පුස්තකාලයක් සඳහා නව ගොඩනැගිල්ලෙහි ස්ථානයක් දැනට වෙන්කර නොමැති බැවින් ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරමි. | අරමුදලේ අරමුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම හා තාත්ත්වික පදනමක් මත ඇස්තමේන්තු පිළියෙල කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) සුරාබදු කාර්මික අපරාධ වැටලීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තා අනුව 2014, 2015, 2016, 2017 සහ 2018 වර්ෂවල සිදුකර ඇති වැටලීම් සංඛ්‍යාවන් පිළිවෙලින් 1101කින්, 387කින් , 339 කින්, 278 කින් හා 631 කින් ලෙස ක්‍රමික අඩු වීමක් නිරීක්ෂණය විය. 2016 වර්ෂයේදී නවක සුරාබදු පරීක්ෂකවරු 48 දෙනෙකු සහ සුරාබදු නියාමකවරු 92 ක් බඳවා ගෙන තිබුණද කාර්මික වැටලීම් සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක වර්ධනයක් නිරීක්ෂණය නොවීය. | කාර්මික අපරාධ වැටලීම් අඩුවීමට හේතු වි ඇත්තේ සුරාබදු නිලධාරීන් විසින් බලපත්‍ර ස්ථාන නිරන්තර අධීක්ෂණයට ලක්කර මනා පාලනයකින් යුතුව නීත්‍යානුකූල රාමුව තුල එම ව්‍යාපාර කරගෙන යාම සඳහා බලපත්‍රධාරීන් යොමු කිරිමයි. ඒ නිසා සුරාබදු බලපත් ස්ථානවල සිදුවන සුරාබදු බලපත්‍ර වල කොන්දේසි කඩකිරීම්වල අඩුවක් දක්නට ඇත. | බලපත්‍ර ස්ථාන පිළිබඳව අඛන්ඩව විධිමත් පරීක්ෂාවක් සිදු කිරීම. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4ක ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය ක්‍රමික වර්ධනය වීමක් දක්නට ලැබුණු අතර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වු දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදාව වැඩි කිරීම සඳහා එම අරමුදල් උපයෝජනය සතුටුදායක මට්ටමක නොවීය. තවද පහත සඳහන් පරිදි වූ අතිරික්ත මුදල් පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි කිරීම සඳහා අරමුදල් උපයෝජනය කිරීමට සැලසුම් සකස් කිරීමට අදාල අංශ දැනුවත් කල අතර ඉදිරියේදී එසේ කරන බව නිරීක්ෂණය කරමි. | අරමුදලේ අරමුණු වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීම සහ අතිරික්ත මුදල් පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර විධිමත් පියවර ගැනීම. |

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට ශේෂය. |
|---|---|
| | රු. |
| 2018 | 415,384,906 |
| 2017 | 388,502,891 |
| 2016 | 362,998,739 |
| 2015 | 330,559,626 |
| 2014 | 258,943,440 |

| | | |
|---|---|---|
| (ඉ) 1999 අංක 8 දරණ දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද අනුව ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | දුම් කොළ තැගි අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතී. | විධිවිධාන ප්‍රකාරව දුම්කොල තැගි අරමුදලක් පිහිටුවීම. |

| | | |
|---|---|---|
| (ඊ) තාක්ෂණ අංශයේ වාර්තා අනුව 2018 වර්ෂය සහ ඉකුත් වර්ෂ කිහිපයක සමථ ගාස්තු ලැබීම් සහ එම සමථ ගාස්තු ලැබීම්වලින් ඒ ඒ බාණ්ඩ සඳහා ත්‍යාග මුදල් පිළිබඳ හිමිකම් ලබන ප්‍රමාණය සහ ගෙවීමට නිර්දේශ කර ඇති ප්‍රමාණයන් අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය. | තෑගි අරමුදලෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ සුරාබදු නිවේදන අංක 818 වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කරමින් පවතින අතර එම සංශෝධනයෙන් අනතුරුව මෙම තත්ත්වයන් වලක්වා ගත හැකි බව සඳහන් කරමි. | සුරාබදු නිවේදන අංක 818 අනුව කටයුතු කිරීම හා අදාල ක්‍රමවේදය විධිමත් පරිදි සමාලෝචනය කිරීම. |
| (උ) සුරාබදු නිවේදනයේ 6 ඡේදය ප්‍රකාරව තෑගි මුදල් සඳහා සුදුසුකම් නිගමනය කිරීමේදී ග්‍රහණයන්ට කෙලින්ම හෝ අනියම් ලෙස හෝ සම්බන්ධ වන සුරාබදු දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ට සහ වෙනත් අයට තෑගි මුදල් දෙනු ලබන බව දැක්වෙතත් ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ නියුතු ඇතැම් නිලධාරීන් සහ වෙනත් අයට මෙම ත්‍යාග මුදල් කිසිවක් ලැබී නොතිබුණු අවස්ථා 255 ක් නියැදි විගණන පරීක්ෂාව අනුව නිරීක්ෂණය විය. | තෑගි අරමුදලෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ සුරාබදු නිවේදන අංක 818 වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කරමින් පවතින අතර එම සංශෝධනයෙන් අනතුරුව මෙම තත්ත්වයන් වලක්වා ගත හැකි බව සඳහන් කරමි. | සුරාබදු නිවේදන අංක 818 අනුව කටයුතු කිරීම හා අදාල ක්‍රමවේදය විධිමත් පරිදි සමාලෝචනය කිරීම. |
| (ඌ) ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා තෑගි මුදල් ගණනය කිරීමේදී දිවයින පුරා පිහිටි සියළුම ප්‍රාදේශීය කාර්යාලවලින් සිදු කරනු ලබන සමස්ථ කාර්මික අපරාධ වාර්තාවලට අදාළ සමථ ගාස්තු පදනම් කරගනු ලැබුවද ප්‍රාදේශීය කාර්යාවල නිලධාරීන් සහ අනෙකුත් අය සඳහා තෑගි මුදල් ගණනය කිරීමේදී ඔවුන් විසින් ඍජු දායකත්වයක් සපයන කාර්මික අපරාධ වාර්තා පිළිබඳව සමථ ගාස්තු පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. සිදුකරන ලද නියැදි පරීක්ෂණයට අනුව 2018 ජනවාරි සිට ජුනි 30 දක්වා කාලය තුළදී ඒ ඒ ශ්‍රේණිවලට අදාළව ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාල වල නිලධාරීන් සහ අනෙකුත් අයගේ ඒක පුද්ගල ත්‍යාග ලැබීම් අතර ප්‍රමාණාත්මක විෂමතාවන් පැවතුණි. | තෑගි අරමුදලෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ සුරාබදු නිවේදන අංක 818 වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කරමින් පවතින අතර එම සංශෝධනයෙන් අනතුරුව මෙම තත්ත්වයන් වලක්වා ගත හැකි බව සඳහන් කරමි. | අංක 818 දරණ සුරාබදු නිවේදනය ප්‍රකාරව කටයුතු කිරීම සහ පවත්නා ක්‍රමවේදය විධිමත් පරිදි සමාලෝචනය කිරීම. |

| | | |
|---|---|---|
| (එ) අංක 818 දරණ සුරාබදු නිවේදනයේ 8 (V) වගන්තිය අනුව ගෙවීමට අවසර දී එක් වර්ෂයක් තුළ නොගෙවන ලද හෝ නොඉල්ලන ලද සියලුම තෑගි මුදල්, අරමුදලේ රඳවා ගත යුතු බවට සඳහන් වුවත්, ඊට පටහැනිව යමින් 2013,2014,2015 හා 2016 වර්ෂවල කාර්මික අපරාධ වාර්තා 410 ක් පදනම් කරගෙන 2018 වර්ෂයේදී රු.මිලියන 2.5 ක තෑගි මුදල් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | තෑගි අරමුදලෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් වූ සුරාබදු නිවේදන අංක 818 වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කරමින් පවතින අතර එම සංශෝධනයෙන් අනතුරුව මෙම තත්ත්වයන් වලක්වා ගත හැකි බව සඳහන් කරමි. | තාත්වික මට්ටමින් පිළියෙල කිරීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයන් පහකට අදාළව ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.මිලියන 3.6 ක මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | අයවැය ලේඛනයේ ඇති විචලතාවයන් හැකිතාත් මගහැරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අය වැය ලේඛණය සැලසුම් සහගතව සහ තාත්වික මට්ටමකින් නියමිත කාල රාමුව තුල පිළියෙල කර ඒ අනුව කටයුතු කිරීම. |